www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 6 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2hours

## Christianity – I
ක්‍රිස්තියානි ධර්මය– I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. දෙවියන් වහන්සේ ලෝකය නිර්මාණය කිරීමේදී සතරවන දවසේ මැව්වේ.
   (1) සිවුපාවුන් හා බඩගා යන සතුන් ය (2) ආකාශ වස්තු ය
   (3) සියලු වර්ගවල ගස් කොළන් ය (4) රාත්‍රිය හා දහවල ය

2. සාගර ජලයේ වඩදිය හා බාදිය ඇතිවීමට බලපාන්නේ,
   (1) සූර්යයා ය (2) චන්ද්‍රයා ය (3) ග්‍රහලෝක ය (4) තාරුකා ය

3. දෙවියන් වහන්සේගේ අත්කම් විදහා පාන්නේ,
   (1) අහස් තලය ය (2) ගුවන් තලය ය
   (3) සාගරය (4) ගස්වැල් ය

4. ජේසුස් වහන්සේගේ උපත මුලින්ම දැනුම් දෙනු ලැබුවේ,
   (1) ශාස්ත්‍රවන්තයින්ට ය (2) එඬේරුන්ට ය
   (3) රජවරුන්ට ය (4) ගවහල්හිමිකරුට ය

5. යුදෙව් ව්‍යවස්ථාවට අනුව පිරිමි දරුවෙකු වැඩිහිටියෙකු ලෙස පිළිගැනුනේ,
   (1) අවු. 15 දී ය. (2) අවු. 10 දී ය. (3) අවු. 12 දී ය. (4) අවු. 14 දී ය.

6. 'එලී එලී ලමා සබක්තානි'' යන ජේසුතුමාගේ වදනේ තේරුම වූයේ,
   (1) පියාණෙනි ඔබගේ අතට මාගේ ආත්මය භාර දෙමි
   (2) පියාණෙනි මොවුන්ට කමාවුව මැනව
   (3) මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?
   (4) ස්ත්‍රිය මේ නුමගේ පුත්‍රයා ය මේ නුඹගේ මෑණියෝ ය

7. ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය අත්දුටු මුල්ම සාක්ෂිකරුවන් වන්නේ,
   (1) ශ්‍රාවකයින් (2) කාන්තාවන්
   (3) ජනතාව (4) දේවදූතයන්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. ශුද්ධ දිනයක් ලෙස නම් කළ හත්වන දවසේදී දෙවියන් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ,
   (1) කා බී ප්‍රීතිවීම ය
   (2) විනෝද ගමන් යෑම ය
   (3) ප්‍රශංසාවෙන් හා ස්තුතිපූර්වකම නමස්කාරයට සහභාගී වීම ය
   (4) උත්සව පැවැත්වීම ය

9. අපට ඖෂධ ලබාදෙන්නේ,
   (1) කොස්, දෙල්. පොල් ය (2) නාරං, අඹ, වෙරළු ය
   (3) ඉරමුසු, පොල්පලා, වෙනිවැල්ගැටය (4) කළුවර,බුරුත, නැඳුන් ය

10. මැවිල්ලේ උතුම්ම ස්ථානය හිමිකර ගන්නේ,
   (1) සතුන් ය (2) ගස්වැල් ය
   (3) මිනිසා ය (4) අහස් තලය ය

11. ගාබ්‍රියෙල් දේවදූතයා හඳුන්වනු ලබන්නේ,
   (1) අනාවැකි කියන්නෙකු ලෙස ය
   (2) පණිවිඩ දන්වන්නෙකු ලෙස ය
   (3) ශුභ ආරංචි ගෙන එන්නෙකු ලෙස ය
   (4) පෙරමඟ කියන්නෙකු ලෙස ය

12. ජේසුස් වහන්සේ දෙමාපියන් සමඟ වාසය කළේ,
   (1) කානාන් නුවර ය (2) බෙත්ලෙහෙමේ නුවර ය
   (3) නාසරෙත් නුවර ය (4) ජෙරුසලම් නුවර ය

13. ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන යාමට උපකාරී වූයේ,
   (1) සිමොන් පේතෘස් ය (2) කිරේසියේ සීමොන් ය
   63) ජුදාස් ඉස්කාරියොත් ය (4) ජොහාන් ය

14. නැවත නැගිටුන ජේසුස් වහන්සේ ප්‍රථමයෙන් ගියේ,
   (1) කානාන් නුවරට ය (2) ගලීලයට ය
   (3) ජෙරුසලමට ය (4) නාසරෙත් නුවරට ය

15. දෙවියන් වහන්සේ මැවූ සියලු දේ,
   (1) අලංකාර ය (2) මනහර ය
   (3) විවිධ හැඩැති ය (4) විවිධ වර්ණවලින් යුක්ත ය

16. සත්ව ලෝකයේ ආදර්ශය තුළින් අපට ආරක්ෂාව ලබා දෙන්නේ,
   (1) අශ්වයා ය (2) බල්ලා ය (3) ගවයා ය (4) අලියා ය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

17. දෙවියන් වහන්සේට ප්‍රසන්න වන වටිනාකමක් නොවේ.

(1) ඉවසීම (2) කරුණාව

(3) වෛරය (4) එකමුතුකම

18. කිතු උපතේ සුවිශේෂී බව වටහා දුන්නේ,

(1) වල්ගා තරුව ය (2) ශාස්ත්‍රවන්තයින් ය

(3) දේවදූතයන් ය (4) ගව ඔරුව ය

19. ''උයන රැකබලා ගැනීම'' යන මිනිසාට ලබාදුන් වගකීමට පටහැනිවන දෙයකි.

(1) සතුන් රැකබලා ගැනීම (2) ගස්වැල් වැවීම

(3) පස ආරක්ෂා කිරීම (4) කඳු කැපීම

20. ජේසුතුමාගේ කුරුසිපත් වීම තුලින් අපට හිමි වන්නේ,

(1) දේව සබඳතාවයි (2) පාපයෙන් මිදීමයි

(3) දේව රැකවරණයයි (4) මරණින් මිදීමයි

(ල.2 x 20 =40)

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල්- 6 ශ්‍රේණිය

## Christianity – II

ක්‍රිස්තියානි ධර්මය– II

Name :- .................................................. Grade : -................ Index number:-....................

❖ **පළමු වන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

1. (i) ජේසුස් වහන්සේ නැවත නැගිටි බව ඇසූ වෙනත් පිරිසක් ලියන්න.
   (ii) ජුදෙව් පාස්කුව යනු කුමක් ද?
   (iii) ජේසුස් වහන්සේ ඇණ ගසනු ලැබූ කපාලපිටිය නම් ස්ථානයට හෙබ්‍රෙව් භාෂාවෙන් හැඳින්වෙන නාමය කුමක් ද?
   (iv) බිළිඳු ජේසුතුමා හඳුනාගැනීමට දේවදූතයින් එඬේරුන්ට දුන් ලකුණ කුමක් ද?
   (v) දෙවියන් වහන්සේ මිනිසාව පදිංචි කළේ කොහේ ද?
   (vi) මැවීම ගැන සඳහන් වන බයිබලයේ පොත කුමක් ද?
   (vii) පහත සඳහන් සතුන් දෙදෙනාගෙන් ඇති ප්‍රයෝජනය බැගින් ලියන්න.

   *අලියා -* *බල්ලා -*

   (viii) ගෘහ භාණ්ඩ සෑදීමට ගන්නා ශාක වර්ග 2කක් ලියන්න.
   (ix) සාගරයෙන් ඇති ප්‍රයෝජන 2කක් ලියන්න.
   (x) සමිඳාණන් වහන්සේ දෙවන දිනයේ මැව්වේ මොනවා ද? (2x10=20)

2. දේව නිර්මාණයේ පුදුමාකාර බව
   (i) දේව නිර්මාණයේ උතුම්ම ස්ථානය හිමි වන්නේ කාට ද? (ල.02)
   (ii) දේව දරුවකු තුල තිබිය යුතු යහපත් ගුණාංග 3ක් නම් කරන්න. (ල.03)
   (iii) යහපත් ගුණාංග සහිතව ජීවත් වන අප සමාජය තුල ක්‍රියා කල යුත්තේ කෙසේ ද? (ල.05)

3. උත්ථානයේ ශුභ ආරංචිය
   (i) සතියේ පළමුවැනි දින ස්ත්‍රීන් සොහොන වෙත ගියේ කුමක් සඳහා ද? (ල.03)
   (ii) සොහොන වෙත ගිය ස්ත්‍රීන් 3 දෙනා නම් කරන්න. (ල.03)
   (iii) ''උන්වහන්සේ මෙහි නැත උන්වහන්සේ උත්ථාන වූ සේක'' මෙම වදන් පැවසුවේ කවුරුන් විසින් කාහට ද?
   (iv) ජේසුතුමාගේ දිවි පිදීමෙන් හා නැවත නැගිටීමෙන් අපට ලැබුනේ මොනවා ද? වෙන වෙනම ලියන්න. (ල.05)

   *දිවිපිදීමෙන් -*



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

***නැවත නැගිටීමෙන් -***

4. ජේසුස් වහන්සේගේ උපත

(i) ජේසුස් වහන්සේගේ උපත තුළින් ගෙන ආ පණිවිඩය කුමක් ද? (ල.02)

(ii) ජේසුස් වහන්සේ දිළින්දන් අතරට ආ බවට ඇති සාක්ෂි 3ක් ලියන්න. (ල.03)

(iii) බිළිඳු ජේසුතුමා බලන්නට පැමිණි තවත් පිරිසක් නම් කරන්න.
ඔවුන් ගෙන ආවේ මොනවා ද? (ල.05)

5. අපට ජීවත් වීමට ජලය අවශ්‍ය වේ.

(i) අපට ජලය ලැබෙන ක්‍රම දෙකක් ලියන්න. (ල.02)

(ii) ජලයෙන් ඇති ප්‍රයෝජන 3ක් ලියන්න. (ල.03)

(iii) ජල සම්පත සුරැකීමට අපට ගත හැකි පියවර කීපයක් ලියන්න. (ල.05)

6. ජේසුස් වහන්සේ අප උදෙසා දිවි පිදූ සේක

(i) මෙම සිදුවීම වූ දවස කිතුනු අප හඳුන්වන්නේ කෙසේ ද? (ල.02)

(ii) ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමට පෙර උන්වහන්සේට කල හිරිහැර 3ක් ලියන්න.
(ල.03)

(iii) 1. උන්වහන්සේ මරණයට පත්වන මොහොතේ ස්වභාව ධර්මය දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?
2. ''දේව මාලිගය කඩා දමා තුන් දවසකින් ගොඩ නගනවා'' මෙහි අදහස ලියන්න.
(ල.05)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk